# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.02 පැය 2200 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1979/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කහටගස්දිගිලිය පොලිස් ස්ථානය.**

2025.11.02 වන අද දින දහවල් කාලයේදී කහටගස්දිගිලිය පොලිස් වසමේ කොක්මඩුව ප්‍රදේශයේදී කහටගස්දිගිලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු හා සැකකාරියක් කැණීම් උපකරණ හා පූජා භාණ්ඩද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 36, 37, 49 හා සැකකාරිය අවුරුදු 45 යන වයස්වල පසුවන කොක්මඩුව, නොච්චියාගම හා රද්දොළුගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කහටගස්දිගිලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හදිසි අනතුරකින් පුද්ගලයෙකු මියයාම - රුවන්වැල්ල පොලිස් වසම.**

2025.11.02 වන අද දින උදෑසන කාලයේ රුවන්වැල්ල පොලිස් වසමේ කිරිපෝරුවවත්ත ප්‍රදේශයේ රබර් කර්මාන්ත ශාලාවක ටැංකියක් පුපුරා යාමෙන් පුද්ගලයෙකු එම ස්ථානයේම මියගොස් තවත් පුද්ගලයන් තිදෙනෙකු තුවාල ලබා කරවනැල්ල රෝහල වෙත ඇතුලත් කර ඇති බවට රුවන්වැල්ල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 25 ක් වූ යටියන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රබර් කර්මාන්ත ශාලාවේ රබර් කිරි ජලයෙන් වෙන්කිරීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍රයක් පුපුරා යාමෙන් මෙම අනතුර සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය අවිස්සාවෙල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර රුවන්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. සැකකටයුතු මරණයක් - පස්සර පොලිස් වසම.

2025.11.02 වන අද දින දහවල් කාලයේ පස්සර පොලිස් වසමේ මාඋස්සාගොල්ල ප්‍රදේශයේ සැකකටයුතු ලෙස පුද්ගලයෙකු මියගොස් ඇති බවට පස්සර පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 63 ක් පමණ වූ මාඋස්සාගොල්ල, පස්සර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු එම නිවසේ තනිව ජීවත්ව සිට ඇති බවටත්, දින කිහිපයකට පෙර මියගොස් ඇති බවටත්, දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා බදුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පස්සර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - මොරටුව පොලිස් වසම.

2025.11.02 වන අද දින උදෑසන කාලයේ මොරටුව පොලිස් වසමේ කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ කටුබැද්ද හන්දිය අසලදී කොළඹ දෙසට ධාවනය වූ වෑන් රථයක් පදික මාරුව හරහා ගමන් කල කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික කාන්තාව බරපතල තුවාල ලබා කළුබෝවිල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 27 ක් වූ පානගම, බලපිටිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කළුබොවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**